# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/ 267/2025 (PSC)**

ඩී.එම්.පී.කරුණාරත්න,
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
**වගඋත්තරකරු**

**දිනය :-2026.06.16**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රාජ්‍ය නිලධාරී එම්.ඩී.එස්.සී.පෙරේරා මහතා,
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම්, ආර්.එම්.පී.ඒ.බණ්ඩාර මහතා.

## -<u>නියෝගය</u>-

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචක ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකි. අභියාචක මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ ගණකාධිකාරී ලෙස සේවය කරමින් සිටි කාලයේ, 2014 වසරේ එම රෝහලේ නව ගොඩනැගිල්ල සඳහා මහජන ඇමතුම් පද්ධතියක් මිලදී ගැනීමේ දී සිදුකරන ලද විෂමාචාරයක් (රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම / පැහැර හැරීම හා රාජ්‍ය සේවය අපකීර්තියට පත්කිරීම) පිළිබඳව 2019.08.29 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ලබාදුන් චෝදනා පත්‍රයට අනුව පැවති විධිමත් ඒක පුද්ගල විනිශ්චය සභාව විසින් පැවැති විනය පරීක්ෂණයෙන් පසුව සියළු චෝදනා සඳහා අභියාචක වැරදිකරු බවට පත්කර ඇත. ඒ අනුව 2024.06.13 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ලබා දී ඇති විනය තීරණයන්ට එදිරිව මෙම අධිකාරයට අභියාචනයක් සිදුකර ඇත. අදාළ චෝදනා පත්‍රය මඟින් නඟා ඇති චෝදනා වන්නේ,

I. ඔබ මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ නව ගොඩනැගිල්ල සඳහා මහජන ඇමතුම් පද්ධතියක් මිලදී ගැනීමේ දී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:4 හා 2:14:1 වගන්තීන් සමඟ කියවිය යුතු 2014.07.04 දිනැති ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28 හි 2:14:1 යටතේ සඳහන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවල අධිකාරී සීමාව ඉක්මවා මිලදී ගැනීම් කිරීමට තීරණය කිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 15 වැනි වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.

II. ඔබ මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ නව ගොඩනැගිල්ල සඳහා මහජන ඇමතුම් පද්ධතියක් මිලදී ගැනීමේ දී, 2016 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සමඟ පරිශීලනය කළ යුතු 2014.07.04 දින නිකුත් කරන ලද අතිරේක අංක 28 ප්‍රකාර ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුවකට මිල සැදහුම් ක්‍රමය යටතේ මිලදී ගත හැකි උපරිම සීමාව රුපියල් මිලියන 01 වඩා වැය වන හෙයින් එම පද්ධතිය මිලදී ගැනීමට විවෘත මිල ගණන් කැඳවීමට කටයුතු නොකිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 15 වැනි වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.

III. ඔබ මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ නව ගොඩනැගිල්ල සඳහා මහජන ඇමතුම් පද්ධතියක් මිලදී ගැනීමේ දී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:9:1 වගන්තියේ විධිවිධාන නොසලකා හරිමින්, කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් නොකිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 15 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.

IV. ඔබ මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ නව ගොඩනැගිල්ල සඳහා මහජන ඇමතුම් පද්ධතියක් මිලදී ගැනීමේ දී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:4:10 වගන්තිවල විධිවිධාන නොසලකා හරිමින්, පිළිගත් ආයතනයකින් කාර්යය සාධන සුරක්ෂණයක් ලබා නොගැනීම මඟින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ

රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 15 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.

V. ඔබ මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ නව ගොඩනැගිල්ල සඳහා මහජන ඇමතුම් පද්ධතියක් මිලදී ගැනීමේ දී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:12:2 හා 8:12:3 යන වගන්ති වල විධිවිධාන නොසලකා හරිමින්, ගෙවීම කිරීමට පෙර වැඩ අවසන් කිරීම පිළිබඳ වාර්තාවක් ලබා නොගැනීම හා තාක්ෂණික කමිටුවේ උපදෙස් අනුව ගෙවීම් කිරීමේ දී 10%ක මුදලක් රඳවා නොගෙන කොන්ත්‍රාත්කරුවන් වෙත මුළු කොන්ත්‍රාත් මුදලම ගෙවීම මඟින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 7 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.

VI. ඔබ, ඉහත I සිට V දක්වා චෝදනාවල සඳහන් වැරදි එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම සිදුකිරීම මඟින් ඔබ දරණ තනතුරත්, පොදුවේ රාජ්‍ය සේවයත්, අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කර ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනයේ 10 වැනි වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.

අදාළ චෝදනා පත්‍රය පිළිබඳව පැවැති විධිමත් විනය පරීක්ෂණයෙන් පසුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.03.22 දින පහත සඳහන් විනය නියෝගයක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට යවා ඇත.

"02. ඩී.එම්.පී.කරුණාරත්න මහතා වෙත නිකුත් කරන ලද මගේ සමාංක හා 2019.08.29 දිනැති චෝදනා පත්‍රය සම්බන්ධයෙන් පැවති විධිමත් විනය පරීක්ෂණයේ පරීක්ෂණ වාර්තාව, පැමිණිල්ල මෙහෙයවීමේ නිලධාරීගේ වාර්තාව, රැකවරණ නිලධාරීගේ වාර්තාව, අදාළ සියලු වාචික හා ලිඛිත සාක්ෂි අධ්‍යයනය කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාව, එම චෝදනා පත්‍රයේ අංක I සිට VI දක්වා වූ සියලු චෝදනා සම්බන්ධයෙන් කරුණාරත්න මහතා වැරදිකරු බවට තීරණය කර පහත දඬුවම් පැනවීමට නියෝග කර ඇත.

I. වැටුප් වර්ධක තුනක් (03) විලම්භනය කිරීමට.

එහි පිටපත්,

1. ලේකම් සෞඛ්‍ය අමාත්‍යාංශය,

2. දිස්ත්‍රික් ලේකම්, මොනරාගල,

3. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,

5. අධ්‍යක්ෂ, කෑගල්ල ශික්ෂණ රෝහල,

5. අභියාචක, බී.එම්.පී.කරුණාත්න වෙත යවා ඇත. අදාළ ලිපියේ අභියාචකට සති 04ක් තුළ මෙම අධිකාරයට අභියාචනයක් කිරීමේ අවස්ථාව පිළිබඳව පැහැදිලිව දක්වා ඇත.

අභියාචක 2024.07.11 දින මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අභියාචක මේ පිළිබඳව 2024.08.14 දින මෙම අධිකාරයට නැවත දැනුම් දීමක් සිදුකර ඒ පිළිබඳව විමසීම් කර ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2025.11.04 දින ලිඛිතව මෙම අධිකාරයට මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, නියමිත සති 4ක් තුළ මෙම අභියාචනය ඉදිරිපත් කර නැති බවත්, ඒ අනුව අභියාචනය ප්‍රතික්ෂේප කරන ලෙසය. එසේ වුවත් අභියාචක විසින් සිදුකරන ලද ලිඛිත පැහැදිලි කිරීම් සහ වාචික පැහැදිලි කිරීම් අනුව 2025.11.06 දින මෙම අධිකාරයේ දි මේ පිළිබඳව මූලික විමසීම් සිදුකර, දෙපාර්ශවයේම කරුණු වලට අවධානය යොමු කරමින්, මෙම අභියාචනය සම්බන්ධයෙන් විමසීමක් කිරීමට මෙම අධිකාරය තීරණය කරන ලදි. (2025.11.06 දින කාර්ය සටහන් අනුව) මේ අනුව ඉදිරියට මෙම කටයුතු සිදුකළ අතර, දෙපාර්ශවයම ලිඛිත දේශන සහ වාචික ප්‍රකාශ මෙම අධිකාරයට සිදුකරන ලදි. අභියාචක 2026.05.26 දින ඇමුණුම් රැසක් සමඟ තම නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදි. අදාළ පැහැදිලි කිරීම් මඟින් අභියාචක දන්වා සිටින්නේ,

(1) මුළු පිරිවැය ඇස්තමේන්තුව තමාගේ වගකීම නොවන බව. ඒ ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සිදුකළ යුතු බව.

(2) අදාළ මිලදී ගැනීම් ක්‍රියාවලිය රුපියල් මිලියන 01 කට වඩා ඉක්මවා යෑම පිළිබඳව මෙම ක්‍රියාවලිය ආපස්සට විග්‍රහ කිරීම තුළින් තීරණයක් ගැනීම සුදුසු බව.

(3) මිල සැසඳුම් ක්‍රමය යටතේ ගිවිසුම් අත්සන් කිරීමක් සිදු නොවන බව සහ ඒ සඳහා අදාළ වන්නේ ඇමුණුම බවය.

(4) 10% ක මුදලක් මාස 03/06 රඳවා ගැනීම පිළිබඳව තාක්ෂණ ඇගයීම් කමිටුවට තීරක බලයක් නැති බවත්, ඒ තීරණය කොන්ත්‍රාත් පිළිගැනීමේ ලේඛනයට ඇතුළත් විය යුතු බවය. එවැනි කොන්දේසියක් ඇගයීම් ලිපියේ නැති බවය.

ඒ අනුව තමා නියමිත පරිදි රාජකාරී ඉටුකර ඇති බවත්, වෙනත් අයට පැවරෙන වගකීම් තමාට බාර ගැනීමට නොහැකි බවත්, සියළු චෝදනා වලින් තමා  නිදහස් කරන ලෙසත්ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් 2026.04.22 දින තම නිරීක්ෂණ මෙම අධිකාරයට ඉදිරිපත් කර ඇත. අදාළ පැහැදිලි කිරීම් අනුව,

චෝදනා I - පරීක්ෂණ නිලධාරී වාර්තාවේ පිටු අංක 20 සිට 52 දක්වා කරුණු අනුව චෝදනා අංක I සඳහා අභියාචක වැරදිකරු බව.

චෝදනා II - පරීක්ෂණ නිලධාරී වාර්තාවේ පිටු අංක 52 සිට 65 දක්වා කරුණු අනුව චෝදනා අංක II සඳහා අභියාචක වැරදිකරු බව.

චෝදනා III - පරීක්ෂණ නිලධාරී වාර්තාවේ පිටු අංක 65 සිට 70 දක්වා කරුණු අනුව චෝදනා අංක III සඳහා අභියාචක වැරදිකරු බව.

චෝදනා IV - පරීක්ෂණ නිලධාරී වාර්තාවේ පිටු අංක 70 සිට 78 දක්වා කරුණු අනුව චෝදනා අංක IV සඳහා අභියාචක වැරදිකරු බව.

චෝදනා V - පරීක්ෂණ නිලධාරී වාර්තාවේ පිටු අංක 78 සිට 101 දක්වා කරුණු අනුව චෝදනා අංක V සඳහා අභියාචක වැරදිකරු බව.

චෝදනා VI- පරීක්ෂණ නිලධාරී වාර්තාවේ පිටු අංක 102 සිට 104 දක්වා කරුණු අනුව චෝදනා අංක VI සඳහා අභියාචක වැරදිකරු බව.

03. එමෙන්ම, මෙම ප්‍රශ්නගත ප්‍රසම්පාදනය සිදුකළ ප්‍රසම්පාදන කමිටුවේ සෙසු සාමාජිකයන් සම්බන්ධයෙන් පහත විනය ක්‍රියාමාර්ග ගෙන ඇත.

| | |
|---|---|
| වෛද්‍ය අධිකාරී ආර්.එම්.ඩී.රත්නායක මහතා (ප්‍රසම්පාදන කමිටු සභාපති) | ❖ මෙම නිලධාරියාට මෙම සිද්ධියට අදාළව අංක HSC/DIS/091/**2018** හා **2020.06.08** දිනැතිව චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් පැවති විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව නිලධාරියාගේ වැටුප් වර්ධක එකක් විලම්භනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව තීරණය කර ඇත. (ඇමුණුම 04)<br>❖ එම තීරණයට එරෙහිව ඒ මහතා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට **2024.05.08** දිනැතිව අභියාචනයක් යොමු කර ඇති අතර, එම අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලදි. (ඇමුණුම 05) |
| යූ.එච්.උපුල් මහතා (ප්‍රසම්පාදන කමිටු සාමාජික) | ❖ මෙම නිලධාරියාට මෙම සිද්ධියට අදාළව PSC/DIS/070/2018 හා **2019.09.12** දිනැතිව චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත.<br>❖ ඒ සම්බන්ධයෙන් පැවති විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව උක්ත චෝදනා පත්‍රයේ චෝදනා අංක III, IV, හා V චෝදනා වලට නිවැරදිකරු බවටත්, අංක I, II, VI චෝදනා වලට වැරදිකරු බවටත් තීරණය කර, නිලධාරියාගේ වැටුප් වර්ධක එකක් විලම්භනය කිරීමා හා අවවාද කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලදි.<br>❖ එම තීරණයට එරෙහිව ඒ මහතා විසින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත **2022.10.31** දිනැතිව අභියාචනයක් යොමු කර ඇති අතර, එය අංක AAT/112/2022(PSC) හා **2025.12.17** දිනැති පරිපාලන විනිශ්චය අධිකාරයේ නියෝගය මගින් නිශ්ප්‍රභ කර ඇත. (ඇමුණුම 07) |

දෙපාර්ශවයම විසින්ම ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සහ වාචික අදහස් ප්‍රකාශ කිරීම් වලට අමතරව, අදාළ විධිමත් විනය පරීක්ෂණ වාර්තා ද අධ්‍යයනය කළ මෙම විනිශ්වය අධිකාරයට පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(01) යම් ප්‍රසම්පාදන කටයුත්තක් සිදුකිරීමට පළමුව ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් වී තිබේද යන්න සොයා බැලිය යුතුය.

(02) අදාළ මහජන ඇමතුම් පද්ධතියක් මිලදී ගැනීම සඳහා කටයුතු අරම්භ කර ඇත්තේ, 2014 වසරේ පෙබරවාරි මාසය තුළදීය. පැ.17 ලිපිය අනුව එය පැහැදිලි වේ. ඒ අනුව 2014.02.27 දින මිල කැඳවීම් සඳහා ආයතන 05කට ලිපි යවා ඇත. අදාළ ලිපිය මඟින් 2014.03.20 ට පෙර මිල ගණන් ඉදිරිපත් කරන ලෙස හා 2014.03.20 දින ප.ව.2.30ට ප්‍රසම්පාදන කමිටුව රැස්වන බවද වැඩිදුරටත් දන්වා ඇත. අදාළ ලිපිය අභියාචක විසින් අත්සන් කර යවා ඇත.

(03) අදාළ භාණ්ඩ පිළිබඳව පිරිවිතරයන් (තාක්‍ෂණ වාර්තාවක්) සැකසීම අවශ්‍ය වන අතර, එම තාක්‍ෂණ කමිටු වාර්තා පදනම් කර මිල ගණන් කැඳවීම් සකස් විය යුතුය. ඒ පිලිවිතර වලට අනුව මිලගණන් කැඳවීම සිදුකළ යුතුය. එසේ වුවත්, පැ.20 ලිපිය අනුව අදාළ තාක්‍ෂණ කමිටුව පත්කර ඇත්තේ මිල ගණන් කැඳවීමෙන් පසුව 2014.06.06 දිනය.

(04) පැ.26 අනුව 2014.06.13 දින තාක්‍ෂණ ඇගයීම් කමිටුව රැස්වී මුලින් කැඳවූ මිල ගණන් මත ප්‍රසම්පාදන Bid Evaluation සිදුකර ඇත.

(05) පැ.27 ලිපිය අනුව 2014.07.15 දින ප්‍රසම්පාදන මණ්ඩලය රැස්වී, අදාළ තීරණය රු.3,018,500.00 ක මුදලකට මහජන ඇමතුම් පද්ධතියක් මිලදී ගැනීමට තීරණය කර ඇත.

(06) පැ.28 ලිපිය අනුව 2014.06.15 දින වෛද්‍ය අධිකාරී විසින් සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් අමතා රුපියල් මිලියන 3.5ක් වෙන්කර දෙන ලෙස ඉල්ලා යවා ඇත.

(07) පැ.11 2014.06.23 දින මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමේ ලිපිය ලැබී ඇත.

(08) ටෙන්ඩරය පිළිගත් බව සහ අදාළ ඇනුවුම් බාරදීම සඳහා වන දැන්වීම් තෝරාගත් ආයතනය වෙත මිලදී ගැනීම සිදුකරන ආයතනයේ ප්‍රධානී විසින් අත්සන් කර දන්වා යැවිය යුතුය. එසේ

වුවත් වූදිත නිලධාරී විසින් එම ටෙන්ඩරය පිළිගත් බව හා ටෙන්ඩරය ප්‍රදානය කරන ලිපිය අත්සන් කර යවා ඇත. පැ.30 අනුව පැහැදිලි වේ. අදාළ ලිපියෙහි කිසිදු කොන්දේසියක් සඳහන් කර නැත.

(09) පැ.26 තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් 10% මුදලක් මාස 06කත් රඳවා ගැනීම සහ සුරක්ෂිත ඇපයක් ලබාගැනීමට දන්වා ඇතත්, අදාළ කොන්දේසි එම පිළිගැනීමේ ලිපියේ සඳහන් කර නැත.

(10) පැ.31 ලිපිය අනුව මුළු මුදලම රු.3,018,500/= 2014.12.12 දින අදාළ ආයතනයට ගෙවා ඇත. එහි වියදම සහතික කර ඇත්තේද මෙම වූදිත ගණකාධිකාරී විසිනි.

(11) පැ.32 ලේඛනය අනුව අදාළ චෙක්පත් බාරදීම පිළිබඳව තොරතුරු සඳහන් වේ.

(12) මෙම භාණ්ඩ පිරිවිතර අනුව නියමිත පරිදි ප්‍රමිතියෙන් යුතුද? පිරිවිතර වලට අනුව නිවැරදි සහ සවිකර ඇතිද, ක්‍රියාකාරී තත්ත්වයේ පවතිද යන්න පිළිබඳව තාරක්ෂණ වාර්තාවක් ලබාගත යුතු වුවද, වූදිත නිලධාරීගේ ප්‍රධානත්වයෙන් යුත් 4 දෙනාගේ කමිටුවක් පරිපාලන නිලධාරී හා කාර්මික නිලධාරීන් අදාළ භාණ්ඩ සවිකර ඇති බවට පමණක් සෑහීමට පත්ව මුදල් ගෙවා ඇත.

(13) මෙම ප්‍රසම්පාදනයට අදාළ මිල ගණන් කැඳවීම් විස්තර ඇතුළත් ලිපි ගොනුව වූදිත භාරයේ තබා ගැනීම සහ වූදිතගේ උපදෙස් පරිදි අදාළ ප්‍රසම්පාදන තීරණ එහි සටහන් කළ බව විෂය ලිපිකරු නිලධාරී විසින් සාක්ෂි මඟික් ප්‍රකාශ කර සිටී.

(14) මෙම කටයුත්තේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව හා ගිණුම් කටයුතු පිළිබඳව අත්දැකීම් ඇති, දැනුම ඇති පුද්ගලයා ලෙස අභියාචක විසින් අනික් නවක නිලධාරීන්ට උපදෙස් ලබාදී, නිවැරදි ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ කිරීම මඟ හැර ඇති බව පැහැදිලිව ඔප්පු වේ.

ඉහත සියළු කරුණු පිළිබඳව සළකා බැලීමේ දී අභියාචක තමාගේ වගකීම් නිවැරදිව මෙම කටයුත්තේ දී සිදුකර නැති බව පෙනේ. එසේම තමාට අයත් නොවන කටයුතු සිදුකර ඇති බවද පැහැදිලිව දක්නට ඇත. ඒ අනුව අභියාචක අදාළ කටයුතු සිදු කිරීමේ දී පැහැදිලිව වරදක් සිදුකර ඇති බව පෙනේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණය සඳහා මැදිහත් වීමක් කිරීමට මෙම අධිකාරය අපේක්ෂා නොකරමු. තවදුරටත් මෙම ප්‍රසම්පාදන කටයුතු

වලට හවුල් වූ අනික් සාමාජිකයන් දෙදෙනා සඳහා ද විනය දඬුවම් ලබා දී තිබීම සළකා බැලීමේ දී අභියාචකගේ දඬුවම් සංශෝධනය කිරීමට අධිකාරය මෙම අවස්ථාවේ දී අපේක්ෂා නොකරමු. රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබා දී ඇති තීරණය තවදුරටත් තහවුරු කරමු. ඒ අනුව අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු. එම තීරණය අභියාචක, ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය නිශ්ප්‍රභ කර ඇත.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-